මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2025.05.16

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## Human Rights Commission of Sri Lanka

ප්‍රියන්ත වීරසූරිය මහතා,
වැඩබලන පොලිස්පති,
ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය,
කොළඹ 02.

වීරසූරිය මහතා,

**සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතෙහි 3වන වගන්තිය සහ අනුස්මරණ උත්සව පිළිබඳ වෙනත් නීති ප්‍රතිපාදනයන් අනිසි ලෙස භාවිතා කිරීම**

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10(ඇ) වගන්තිය අනුව ජාතික නීති සහ පරිපාලනමය පිළිවෙත්, ජාත්‍යන්තර මානව හිමිකම්වලට, නියමයන්ට හා සම්මතවලට අනුකූල බව සහතික කිරීම පිණිස ගත යුතු පියවර සම්බන්ධයෙන් ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම ලිපිය යොමු කරනු ලැබේ.

උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්වනු ලබන අනුස්මරණ උත්සව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024 මැයි මස එවකට සිටි පොලිස්පතිවරයා වෙත ලිපියක් මඟින් දැනුවත් කළ බව සිහිපත් කර සිටිමු. සාමකාමී විරෝධතා පැවැත්වූ පුද්ගලයින් ඇතුළුව අනුස්මරණ කාර්යයන් වල යෙදුනු පුද්ගලයන් 2007 අංක 56 දරණ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතෙහි 3 වන වගන්තියට පටහැනිව අත්අඩංගුවට ගැනීම සම්බන්ධව මෙහිදී සැලකිල්ලට ගෙන ඇත. තවද, කොමිෂන් සභාවට වාර්තා වී ඇති පරිදි ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන්, 2009 යුධ ගැටුම්වලින් මිය ගිය දමිළ තැනැත්තන් අනුස්මරණය කිරීම වැළැක්වීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 26 වන පරිච්ඡේදයේ 106(1) වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරුන්ගේ තාවකාලික නියෝග මත ක්‍රියා කරන අතර ඇතැම් අවස්ථාවල කැඳ බෙදීම වැනි සාමකාමී අනුස්මරණ ක්‍රියා මහජන සෞඛ්‍ය කාරණා මත පදනම්ව වලක්වා ඇත.

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතෙහි 3 (1) වගන්තිය ප්‍රකාරව ජාතිය, වර්ගය හෝ ආගම මත පදනම්ව වෙනස්කොට සැළකීමට, සතුරුකම් සහ ප්‍රචණ්ඩත්වය ඇති කළ හැකි වෛරී ක්‍රියාවන් පැතිරවීම අපරාධමය වරදක් කොට සළකයි. මෙම සංකීර්ණ වූ අපරාධමය වරද තුළ මූලධර්ම කිහිපයක් ඇතුළත් වන අතර ඒවා නිතරම වැරදි ලෙස භාවිතා වෙයි. මෙම වගන්තිය නිවැරදිව භාවිතා නොවන බවට සොයාගත් කරුණු මත 2019 අගෝස්තු මස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ***සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතෙහි 3වන වගන්තියේ විෂය පථය පිළිබඳ මාර්ගෝපදේශ*** ප්‍රකාශයට පත් කර ඇත (ඇමුණුම අ). ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් SC (F.R.) Application No. 135/2020 අංක දරන නඩුවේදී ද මෙම මාර්ගෝපදේශ තහවුරු කර ඇත. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතෙහි 3 වන වගන්තිය යටතේ ඕනෑම ආකාරයක ප්‍රකාශනයක් වරදක් වීමට නම්, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් කරුණු කිහිපයක් සැලකිල්ලට ගත යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය අවධාරණය කරයි. මෙම කරුණු අතරින් වඩාත්ම වැදගත් වන්නේ එම ප්‍රකාශය වෙනස් කොට සැලකීමට, සතුරුකමට හෝ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීමක් කරන්නේද යන්නයි. ඒ අනුව නීති ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් එකී ප්‍රකාශනය මගින් සැබෑ හානියක් සිදු කළ හැකිද යන්න සලකා බැලීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් 2022 මැයි මස නිකුත් කළ නිර්දේශයට අනුව එවකට පොලිස්පතිවරයා විසින් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතෙහි 3 වන වගන්තියට අදාළ විමර්ශන සම්බන්ධයෙන් අංක RTM 541 චක්‍රලේඛය නිකුත් කර ඇත. එම චක්‍රලේඛය මගින් ඉහත කී වගන්තිය යටතේ සිදු කරන පරීක්ෂණ, ශ්‍රී ලංකා පොලීසියේ නීති අංශයේ අධ්‍යක්ෂවරයාගේ උපදෙස්

ප්‍රධාන කාර්යාලය
தலைமைக் காரியாலயம் 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04.
14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.
සභාපති
தவிசாளர்
Chairperson 011-2505451
ෆැක්ස්
தொலைநகல்
Fax 011 2505541/74
විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
E-mail sechrcsl@gmail.com

මත පමණක් සිදු කරන ලෙසට පොලිස් ස්ථානාධිපතිවරුන්ට නියම කර ඇත. තවද, එම පනතේ විධිවිධාන අනිසි ලෙස භාවිතා කරන ඕනෑම පොලිස් නිලධාරියකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා බවට ද සඳහන් කර ඇත.

සාමකාමී අනුස්මරණ කිරීම් සහ ආහාර බෙදාහැරීම් වෙනස් කොට සැලකීමකට, සතුරුකමකට, හෝ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීමක් ඇති කරන ක්‍රියා ලෙසට සැලකිය නොහැකි බවත්, එවැනි ක්‍රියාවන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස යටතේ ආරක්ෂා කර ඇති බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දක්වා සිටී. එසේ හෙයින්, එවැනි අවස්ථාවන් සඳහා සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතෙහි 3 වන වගන්තිය භාවිත කිරීම සුදුසු නොවන අතර, යම් හෙයකින් එකී වගන්තිය භාවිත කළහොත් එමගින් පුද්ගලයන්හට හිරිහැර සිදුවීම සහ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසට ඇති අයිතිය උල්ලංඝනය වීම සිදුවිය හැකිය.

තවද, අනුස්මරණ ක්‍රියාවන් සාමූහික හානිපූරණයේ කොටසක් වන අතර, ඊට ගරු කිරීමට සහ ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා රජයට ව්‍යවස්ථාපිත වගකීමක් ඇත. 2018 අංක 34 දරණ හානිපූරණ සඳහා වන කාර්යාල පනත මඟින් සාමූහික හානිපූරණය යන්න "පීඩාවට පත් තැනැත්තන් කණ්ඩායම් හෝ කොට්ඨාස සඳහා ඵලදායී ප්‍රතිකර්ම සහ ප්‍රතිලාභ සඳහා වන අයිතිවාසිකම් පිළිගැනීම අරමුණු කරගත් යම් පියවර අදහස් විය යුතු බවත්, ඊට (අ) ස්මාරක ඇතුළුව මියගිය තැනැත්තන් අනුස්මරණ ක්‍රම... " ඇතුළත් වියයුතු බවත් දක්වමින් අර්ථකතය කර ඇත. එබැවින් දමිළ ප්‍රජාව තුළ පීඩාවට පත් පුද්ගලයින්ට මියගිය පුද්ගලයින් සිහිපත් කරමින් සාමූහික හානිපූරණය සිදු කිරීමට ඇති අයිතියට ලැබිය යුතු ගෞරවය සහ ආරක්ෂාව ලබා දිය යුතුය.

අනුස්මරණයේ අයිතිය පිළිගනිමින් 2017 වසරේදී අතිගරු ජනාධිපති වෙත කොමිෂන් සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් කළ බවටද මෙමඟින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිහිපත් කරයි (ඇමුණුම ආ). එමගින් පුද්ගලයකුගේ තත්ත්වය හෝ දේශපාලන මතයන් නොතකමින් සියලු ප්‍රජාවන්ට ඔවුන්ගේ ආදරණීයයන්ගේ වියෝව පිළිබඳ ශෝක වීමට සහ ඔවුන් සිහිපත් කිරීමට අවකාශය සහ හැකියාව තිබිය යුතු බවට අවධාරණය කරයි.

මෙම පුළුල් සන්දර්භය තුළ සාමකාමී අනුස්මරණ කිරීම් (එනම් මියගිය පුද්ගලයන් සිහිපත් කිරීම) දමිළ ප්‍රජාව තුළ පීඩාවට පත් පුද්ගලයින්ගේ සාමූහික හානිපූරණයේ කොටසක් ලෙස නීතියෙන් පිළිගෙන ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසියේ සියලු අංශ වෙත භාෂා තුනෙන්ම පැහැදිලි මාර්ගෝපදේශ නිකුත් කළ යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි. තවද, ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය ප්‍රවර්ධනය නොකරන ක්‍රියාවන් මෙන්ම වෙනස් කොට සැලකීම්, සතුරුකම් හෝ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීමක් ඇති නොකරන ක්‍රියාවන්ට (එනම්, එම ක්‍රියාවෙන් ආසන්න හානියක් සිදු වීමට සාධාරණ සම්භාවිතාවක් නොමැති ක්‍රියාවන්) ගරු කළ යුතු බවත් ආරක්ෂා කළ යුතු බවත් අවධාරණය කරයි. එසේම ඉහත කී මාර්ගෝපදේශ මඟින් අදාළ පරිපාලන අංශවල පොලිස් ස්ථානාධිපතිවරුන්හට සාමකාමී අනුස්මරණ වැළැක්වීමට අධිකරණ නියෝග ලබා ගැනීමෙන් වැළැකී සිටින ලෙස උපදෙස් ලබා දිය යුතුය.

මෙම කරුණ සම්බන්ධව ඔබගේ ඵලදායී මැදිහත්වීම අගය කරන අතර, ඉහත නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලිසියට සහාය වීමට සහ උපදෙස් ලබා දීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සූදානම් බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත් : 1. අතිගරු අනුර කුමාර දිසානායක,
ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති,
ආරක්ෂක අමාත්‍ය,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

2. අමාත්‍ය,
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
18 වන මහල, "සුහුරුපාය",
බත්තරමුල්ල.